# Provincial Department of Education- Sabaragamuwawa

## Sathi Pasala

Week: 08

Subject : JAPANESE LANGUAGE

Prepared by: Isara Costa

R/Nivi/ Elapatha Maha Vidyalaya

Grade :- 11

Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

# UNIT 49

# ජපන් ජාතිකයින් සහ නිෂ්පාදන

ඔබ ජපානයේ නිෂපාදිත භාණ්ඩ භාවිත කර තිබෙනවාද? එම භාණ්ඩ භාවිතයෙන් පසු ඒ පිළිබඳ ඔබගේ අදහස කුමක්ද?

අද ජපන් ජාතිකයින් සහ භාණ්ඩ නිෂ්පාදන පිළිබඳව කල්පනා කරමු.



ජපානයේ විවිධ සමාගම් තිබෙනවා. ඔබ නම් අසා ඇති සමාගම්ද විශාල ප්‍රමාණයක් ඇති නේද?



# වාහන සමාගම්

HONDA




ISUZU




TOYOTA



# ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන සමාගම්

Panasonic









TOSHIBA





SONY




©2011 Sony Computer Entertainment Inc. All rights reserved.
Design and specifications are subject to change without notice.



# ආහාර නිෂ්පාදන සමාගම්

Eat Well, Live Well.
AJINOMOTO®





明日をもっとおいしく
meiji
株式会社 明治








Glico




ජපානයේ සමාගම් විසින් නිපදවන නිෂ්පාදන, ලෝකයේම පුද්ගලයින් විසින් භාවිත කරමින් ඉන්නවා
ජපන් නිෂ්පාදන වල තත්වය ඉතා හොඳ වන අතර, දිගු කල් පැවැත්මක්ද තියෙන නිසානෙ!

# Q 1

Cup Noodles නම් ජපන් ආහාරය 1970 දශකයේ ජපන් ජාතිකයෙක් විසින් සිදුකරන ලද නව සොයාගැනීමකි. එම නව සොයා ගැනීම සඳහා හේතු වන්නට ඇත්තේ කවර පිරිසක්ද?






① බොහෝ කාර්යබහුල සමාගම් සේවකයින්



② හෂි හාවිත කිරීමට නොදත් විදේශ ශිෂ්‍යයින්



③ ආහාර පිසීමට නොදත් අවිවාහක පිරිමින්



④ ශාරීරික දුබලතාවන්ගෙන් යුත් වයස්ගත පිරිස්




**どんぶり** බඳුන සහ හශිකූරු භාවිත කිරීමේ සිරිත් නොදන්නා විදේශ ජාතිකයින් දෙස බලා, කෝප්පයට දමා ගැරුප්පුවෙන් වුවද ආහාරයට ගත හැකි Cup Noodle අදහස ඔහුට සිහියට නැගුනා විය හැකි.



# ජපන් ජාතිකයින් විසින් නිපදවූ විවිධ දේවල්

Instant Ramen




නිස්සින් ආහාර වල ආරම්භකයා වූ මොමොෆුකු අන්දො මහතා, දෙවන ලෝක යුද්ධයට පසු අවධියේ කලුකඩ වෙළඳසැලෙහි රාමෙන් ආපනශාලා අසල දිගු පෝලිම් වල රැඳී සිටින ජපන් ජාතිකයින් දැක, 、 නිවසේදී පහසුවෙන් සාදා ගත හැකි රාමෙන් නිපදවීමට තීරණය කළේය.



# ජපන් ජාතිකයින් විසින් නිපදවූ විවිධ දේවල්

මෙතෙක් භාවිත වූ ද්‍රවයෙන් සැදූ 'තෙත් කෝෂ' විවිධ අපහසුතාවන් ඇති කල නිසා, නිදර්ශක යොදා සැදූ වියැලුණු 'වියලි කෝෂ' නිෂ්පාදනය කරන ලදී.




かんでんち



# ජපන් ජාතිකයින් විසින් නිපදවූ විවිධ දේවල්




**レトルトカレー**






# ජපන් ජාතිකයින් විසින් නිපදවූ විවිධ දේවල්

මෙතෙක් පැවතියේ දිගු හැඩැති මදුරු දගර විය. එය බිඳ දැමීමටද ඉතා පහසු වන අතර, භාවිත කළ හැකි කාලයද කෙටි විය. එම නිසා සර්පිලාකාර මදුරු දගරයක් නිර්මාණය කරන ලදී. එය කැඩීමට අපහසු වන අතර දිගු කාලයක් පවතී.





うすまきがたかとりせんこう

## Q 2

පහත දැක්වෙන්නේ ජපන් සමාගමක් විසින් නිෂ්පාදනය කරන ලද උපකරණයකි. එම උපකරණය භාවිත කරන්නෙ කිනම් කාර්යයක් සඳහාද?




① ශරීර උෂ්ණත්වය මැනීම සඳහා

② කණ පිරිසිදු කිරීම සඳහා

③ උගුරෙහි බෙහෙත් ආලේප කිරීම සඳහා


④ ශරීරයේ පසුපස ප්‍රදේශය පිරිසිදු කිරීම සඳහා



මෙය දුරකථනයක් මෙන් අතේ ගෙන යා හැකි ශරීරයේ පිටුපස ප්‍රදේශය සේදීමේ උපකරණයකි. ඔබ යන ස්ථානයන් වල සේදීමේ යන්ත්‍රයක් නොමැති වැසිකිළි පමණක්ම තිබුණද, මෙය ඇත්නම් එය අස්වැසිල්ලක් වේ.



©TOTO




けいたいようおしりせんじょうき



දුරකථන මෙන් අතේ ගෙන යා හැකි තවත් නිෂ්පාදන බොහොමයක් තිබේ. මෙය ආර්ද්‍රතාකාරකයක් වන අතර බලශක්ති ප්‍රභවයක් නොමැතිව ජලය එකතු කිරීමෙන් වියළීම වැළැක්වීම සඳහා තෙතමනය වාෂ්ප කරයි. රැකියා ස්ථානයට හෝ ගුවන් යානයකට ඉතා පහසුදායී වේ.

## けいたいようのかしつき








මෙය අතේ ගෙන යා හැකි කුඩා වැසිකිළියක් වේ. දිගු බස් ගමන් වලදී හෝ වාහන තදබදයකදී ඉතා පහසුදායී වේ. භාවිතයෙන් පසු අමුණා ඇති බෙහෙත් එයට දැමු විට, ඇතුලත තිබෙන දියරය ඉක්මණින් ඝණ බවට පත් වන නිසා, එය කුණු කූඩයට විසි කළ හැකිය.

## けいたいようのトイレ








තවද, මෙය ඉතා පහසු අතේ ගෙන යා හැකි ජල පවිත්‍රකාරකයක් වන අතර, හදිසි  අවස්ථාවකදී ගංගා ජලය පානීය ජලය බවට  පරිවර්ථනය කරයි. හදිසි අවස්ථාවකදී ජලය වැදගත් වන බැවින් එය ඉතා වටිනා වේ. මොන වගේ වෙලාවක, මොන වගේ දේවල් අවශ්‍යද කියලා හොදින් කල්පනා කර මේ දේ නිර්මාණය කර තිබෙනවා නේද?




## けいたいようせいすいき

## Q 3 ජපානයේ නවීන පන්නයේ වැසිකිළියක ජලය මුදා හැරීම සඳහා සවි කොටා ඇති උපාංගයන්හි අනිවාර්යයෙන්ම දක්නට ලැබෙන්නේ පහත දෑ අතරින් කවරක්ද?




① ජලය මුදා හරින ලීවරය වැඩිහිටියන් හා දරුවන් සඳහා වෙන්ව සවි කොට තිබීම.

② මුදා හරින ජල ප්‍රමාණය පාලනය කළ හැකි වීම

③ ජලය මුද හැරීම සිහිකරවීමට සීනුවක් නාද වීම

④ මුදා හරින ජලයෙහි වර්ණය තෝරා ගත හැකි වීම




ජපන් වැසිකිළියේ ලීවරයක් ඇති අතර එය වැසිකිළියේ ජලය ගලා යන ප්‍රමාණය(අඩු හෝ වැඩි)තොරා ගැනීමට ඉඩ සලසයි. ගලා යන ජල ප්‍රමාණය වෙනස් වීමෙන්, ජලය ඉතිරි වන අතර එය වර්ථමාන තත්වයටද හිතකර වන කාර්යයකි. තවද විවිධාකාරයේ, පරිශීලකයාගෙ ක්‍රියාවන් පිළිබඳ සිතා සාදන ලද බොහෝ දේ තිබේ.



# ශරීරයේ පිටුපස ප්‍රදේශය සෙදීමේ වැසිකිළිය

ශරීරයේ පිටුපස ප්‍රදේශය සෙදීමේ වැසිකිළිය භාවිත කරන්නාගේ හේදීම හොඳින් කල්පනා කර නිපදවා ඇති අතර, භාවිත කිරීමටද ඉතා පහසු වේ.





# ශරීරයේ පිටුපස ප්‍රදේශය සෙදීමේ වැසිකිළිය

වැසිකිළි ආසනය උණුසුම් නිසා ඔබ වාඩි වී සිටින විට සීතල දැනෙන්නේ නැත.





# ශරීරයේ පිටුපස ප්‍රදේශය සෙදීමේ වැසිකිළිය

ශරීරයේ පිටුපස සේදීමේ තුඩ ඉදිරියට හා පසුපසට ගමන් කරන නිසා, පිරිසිදුවට හොඳින් සේදේ.





# ශරීරයේ පිටුපස ප්‍රදේශය සෙදීමේ වැසිකිළිය

සෝදා හැරීමෙන් පසු කුඩා කරාමය මගින් පිටවන ජලයෙන් ඉක්මණින් අත සෝදා ගත හැකි නිසා ඉතා පිරිසිදු වේ.





# ශරීරයේ පිටුපස ප්‍රදේශය සෙදීමේ වැසිකිළිය

වැසිකිළිය භාවිත කරන පුද්ගලයින්, වැසිකිළිය පිරිසිදු කිරීමට අවශ්‍ය යැයි සිතයි. එමනිසා ඉක්මණින් අපවිත්‍ර නොවන අමුද්‍රව්‍ය භාවිත කිරීම, ජලය ගලා යාමේ ක්‍රමය වන තෙක්ම මාර්ගයක් සදයි.






ඇත්තටම භාවිත කරන පුදගලයාගේ හැඟීම් වැදගත් කරල තියෙනවනෙ!!



**Q 4**

මෙම ගැටලුව සඳහා ඔව් හෝ නැත වශයෙන් පිළිතුරු සපයන්න.

**カップうどん**ජපානයේ කවර ප්‍රදේශයකදී මිලට ගනු ලැබුවත් සමාන රසකින් යුක්ත වේ.

はい




いいえ

ජපානයේ නැගෙනහිර සහ බටහිර ප්‍රදේශයන්හි රසයන් වෙනස් වේ. මුලදී, නැගෙනහිර ජපානයේ සහ බටහිර ජපානයේ වඩාත් කැමැත්තක් දක්වන දශි සුප් තොගයේ රස වෙනස් විය. එමනිසා, මෙම කප් උදොන්ද කලාපයන්ට අනුව රස වෙනස් වේ.









මෙම බත් පිසිනයද, භාවිත කරන පුදගලයාගෙ කැමැත්තට අනුව විවිධ ආකාරයෙන් පිසීමට හැකි. ඝන, සැහැල්ලු, බර, පැණි රස වැනි වර්ග 100කට වඩා ඇති බව පෙනේ.



බත් විතරක් එතරම් රසයන්ට වෙනස් වෙනවද? පුදුමයි!!





ජපන් ජාතිකයින් අතීතයේ සිටම උපකරණ අගය කරමින් පැමිණියහ. මිනිසුන් උපකරණ සමග ගැලපීම වෙනුවට, කෙසේ කල විටද උපකරණ මිනිසුන් සමග ගැලපෙන්නේ යැයි හොඳින් සිතන්න විය. එමනිසා ඉතාමත් පරිස්සමින් එම උපකරණ හවිත කරයි. දැන් වුවද එම හැඟීමෙන් කටයුතු කරන විට විවිධ අදහස් සිතට ගලා පැමිණේ.

